# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2368/20 – 2024 ජනවාරි මස 23 වැනි අඟහරුවාදා – 2024.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වන වගන්තිය යටතේ වූ පවරා ගැනීමේ නියෝගය අවලංගු කිරීම

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වන වගන්තිය යටතේ බස්නාහිර ප්‍රදේශ සංවර්ධන අමාත්‍යවරයා වෙත පැවරී තිබූ බලතල ප්‍රකාර 2003.01.27 දිනැති අංක 1273/5 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 2003.11.27 දිනැතිව අංක 1316/9 දරන *අතිවිශෙෂ* (සංශෝධිත) *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ 15 (1) වන වගන්තිය යටතේ නියෝගයෙන් එවකට එකී විෂයභාර අමාත්‍යවරයා විසින් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරිය සතු කරනු ලැබීය.

එනමුත්, නාගරික සංවර්ධන අධිකාරියේ කාර්යයන් සඳහා අධිකාරියට එකී දේපළ අවශ්‍ය නොවන බවට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වන ප්‍රසන්න රණතුංග වන මම තීරණය කරන හෙයින්, අංක 1273/5 සහ 2003.01.27 වැනි දින රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2003.11.27 දිනැතිව අංක 1316/9 දරන අතිවිශෙෂ (සංශෝධිත) *ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත 15 (1) වන වගන්තිය යටතේ වූ නියෝගය මෙයින් අවලංගු කරමි.

**ප්‍රසන්න රණතුංග (පා.ම.),**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 ජනවාරි මස 18 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 සහ 18 වන මහල,
"සුහුරුපාය".
බත්තරමුල්ල.

1A – G 41313 – 07 (2024/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාව ඇතුළත මහරගම ගමේ පිහිටි බටදොඹගහවත්ත *නොහොත්* හෙදවකගහවත්ත සහ ගොඩපරගහවත්ත *නොහොත්* ගොරකගහවත්ත. උතුරින්: දුම්රිය රක්ෂිතය ද; නැගෙනහිරින්: බටදොඹගහවත්ත *නොහොත්* හෙදවකගහවත්ත නමැති ඉඩම ද; දකුණින්; පරණ කොට්ටාව පාර ද; බටහිරින්; මාර්ගයෙන් ද මායිම් වන්නා වූ රූඩ් එකයි පර්චස් තිස් අටයි දහම දෙකයි බිංදුවක් (රූඩ් 01, පර්චස් 38.20) බිම් ප්‍රමාණයෙන් සමන්විත වන්නා වූද, බලයලත් මිනින්දෝරු එච්. ජී. ප්‍රනාන්දු මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 3845 හා 1991.06.03 දින දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක " ඒ " වශයෙන් දැක්වෙන්නා වූ බිම් කැබැල්ල.

EOG 12-0208